# උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ හා නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ තනතුරු වලට පත්කිරීම සඳහා අයදුම්පත් කැඳවීම.

උතුරු මැද පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයට අයත් පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් නිලධාරින්ගෙන් දීපව්‍යාප්තව අයදුම්පත් කඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | තනතුර අයත් සේවය හා ශ්‍රේණිය | සුදුසුකම් | තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01. | පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය I ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• I වන ශ්‍රේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 01 |
| 02. | අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය I ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ I ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• I වන ශ්‍රේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 01 |
| 03. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය II ශ්‍රේණිය | • ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ II ශ්‍රේණියේ නිලධාරියෙකු වීම.<br>• II වන ශේණියේ වසර 03 ක පළපුරුද්ද සහිත නිලධාරියෙකු වීම.<br>• කෘෂි සංවර්ධන ධාරාවට අයත් නිලධාරියෙකු වීම | 03 |

02. වෙනත් සුදුසුකම්

I අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න 05 වසරක කාල සීමාව තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතුය

II වයස් සීමාවන් අදාල නොවේ

III අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට පත්කිරීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

IV අයදුම්පත් කැඳවන දිනට ආසන්න වසර 05 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් පැවතීම හා වැටුප් වර්ධක උපයා ගෙන තිබීම.

සටහන - සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතික වල සහතික කරන ලද ඡායා පිටපත් ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතුය.

03. බඳවා ගැනීමේ ක්‍රමය

මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ අදාල ශ්‍රේණිවලට අයත් අයදුම්කරුවන් අතුරින් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකදී උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාර තුමා විසින් අනුමත කරනු ලැබ ඇති ලකුණු පටිපාටිය අනුව පිරිනමා ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ. (ලකුණු ලබා දීමේ පටිපාටි ඇමුණුම I,II, III )

04. වෙනත් කොන්දේසි

I. 2014.09.19 දිනැති අංක 1880/26 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ හා අංක 1971/17 රණ 2016 ජුනි 15 දින නිකුත් වූ ශ්‍රී ලංකා කෘෂිකාර්මික සේවාව පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහය අතිවිශේෂ ලැසට් පත්‍රෙය් පළ වූ ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ කොන්දේසි හා උතුරු මැද පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සඳහා 2013.01.01 දිනට අනුමත කාර්ය මණ්ඩල වාර්තාවේ සඳහන් කරුණු මෙම බඳවා ගැනීම සඳහා බල පවත්වනු ලැබේ.

II. තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට හා මුදල් රෙගුලාසි වලට ද දෙපාර්තමේන්තු නියෝග වලටද රජය හා උතුරු මැද පළාත් සභාව දැනට නිකුත් කර ඇත්තා වූ ද ඉදිරියේදී නිකුත් කරනු ලබන්නා වූද රෙගුලාසි හා නියෝග වලටද අනුකූලව ක්‍රියා කල යුතුයි.

III. මෙම බඳවා ගැනිමේ නිවේදනයේ විධි විධාන සලසා නැති කරුණු සම්බන්ධයෙන් ගැටළුවක් මතු වුවහොත් උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාර තුමාගේ එකඟතාවය ඇතිව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව එම ගැටළු සම්බන්ධයෙන් අවසන් තීරණය ගනු ලැබේ.

05. අයදුම්පත් ඉදිරිපත් කිරීම.

I. සියළුම අයදුම්පත් ඇමුණුම IV අනුව සකස් කර විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හා අදාළ අමාත්‍යාංශ ලේකම්ගේ/කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශ සහිතව 2026.03.06 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුයි.

II. අයදුම්පත බහාලන කවරයේ වම් පස ඉහළ කෙලවරේ “(ඉල්ලුම් කරන තනතුර සඳහන් කරන්න) තනතුර සඳහා අයදුම්පත් කැඳවීම “ යනුවෙන් සඳහන් කල යුතුයි.

III. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් හා අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

IV. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව භාරගනු නොලැබේ.

ලේකම්,<br>
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,<br>
උතුරු මැද පළාත,<br>
අනුරාධපුර.<br>
2026.02.13